... අංකය } ... අංක: 05/2011
මගේ අංකය
எனது இல.
My No. } RG/MBD/ 10/වවධ/පොදු/2011

ඔබේ අංකය
உமது இல.
Your No. }

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. } 2889488 2889489

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No. } 2889491

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } rgd@sltnet.lk rg@rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகம் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය
இணையத்தளம்
Web site } www.rgd.gov.lk

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. } 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

දිනය / திகதி / Date: 2011/06/22

සියළුම උප්පැන්න මරණ හා වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් වෙත

**බන්ධනාගාරයේ දඬුවම් ලබන මව්වරුන්ට ඉපදෙන දරුවන්ගේ උපත් ලියාපදිංචි කිරීම**

බන්ධනාගාරයේ දඬුවම් ලබන මව්වරුන්ට බන්ධනාගාරයේදී උපදින ළමුන්ගේ අනාගතය පළිබඳ සලකා, එම උප්පැන්න සහතිකවල බන්ධනාගාරය සම්බන්ධ කිසිම තොරතුරක් ඇතුළත් නොකර, ලියාපදිංචි කිරීමට පියවර ගත යුතුව ඇත.

02. ඒ අනුව බන්ධනාගාරගතව දඬුවම් ලබන කාන්තාවන් බන්ධනාගාරයේදී දරුවන් ප්‍රසූත කරන අවස්ථාවලදී, එම දරුවන්ගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ දී 16 වගන්තිය යටතේ වන ප්‍රකාශයක් මවගෙන් ලබාගෙන, පහත පරිදි කටයුතු කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

| | |
|---|---|
| 1. 01 වන තීරය උපත් ස්ථානය: | උපත් ස්ථානය බන්ධනාගාරය යනුවෙන් සටහන් නොකර, බන්ධනාගාරය පිහිටි ප්‍රදේශයේ නම පමණක් සටහන් කිරීම. උදා:- බොරැල්ලේ දී |
| 2. 09 වන තීරය දැනුම් දෙන්නා: | දැනුම් දෙන්නා වශයෙන් මවගේ නම සහ මවගේ ස්ථිර පදිංචි ලිපිනය සටහන් කිරීම. |
| 3. 10 වන තීරය දැනුම් දෙන්නාගේ අත්සන: | "16 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍රය මත ලියා පදිංචි කරන ලදී" යනුවෙන් සටහන් කිරීම. |

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් 1) ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස.

2) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් -මේ සමග අමුණා ඇති 16 වගන්තිය යටතේ වන ප්‍රකාශපත්‍රය මව්වරුන්ට ලැබෙන්නට සැලැස්වීමට සහ සම්පූර්ණ කරන ලද ප්‍රකාශ පත්‍ර අදාල රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කිරීම සඳහා දැන ගැනීමට

3) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -දැ.ගැ.ස.

4) සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.

5) සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.